| | | | | |
|---|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2136600<br>011-2136650 | | මගේ අංකය / எனது இல. / My No. | PSC/DIS/06/IO/2023 |
| ලේකම් / செயலாளர் / Secretary | 011-2136602 | | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2876169<br>011-2876181 | | දිනය / திகதி / Date | 2023.07. 17 |
| විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail | info@psc.gov.lk | | | |
| වෙබ් අඩවිය / இணையத்தளம் / Website | www.psc.gov.lk | | | |

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


සියළුම අමාත්‍යාංශ ලේකම්වරු
සියළුම ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයේ ලියාපදිංචි වීම සඳහා සේවයේ නියුතු නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන විනය පරීක්ෂණවල ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා, විශ්‍රාමික නිලධාරීන්ට අමතරව, සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන්ටද අවස්ථාවක් ලබාදෙමින් විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතය පුළුල් කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතය සඳහා සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට කොමිෂන් සභාව තීරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

03. මේ සම්බන්ධයෙන් ඔබගේ <u>ප්‍රමුඛ අවධානය යොමුකර</u> මේ සමඟ යොමුකරනු ලබන අයදුම්පත් කැඳවීමේ නිවේදනය සම්බන්ධයෙන් ඔබ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ඉදිරිපත්වන අයදුම්පත් 2023.08.25 දිනට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

තනුජා මුරුගේෂන්
වැඩ බලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයේ ලියාපදිංචි වීම සඳහා සේවයේ නියුතු නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් වන නිලධාරීන් විසින් සිදු කරනු ලබන ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමුවන උපලේඛනය යටතේ දැක්වෙන වැරදි පිළිබඳ විනය පාලන කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෘජුවම සිදු කරනු ලබන අතර, ඒ සඳහා විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයේ විනය පරීක්ෂණ නිලධාරීන් වශයෙන් ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන පහත සඳහන් සුදුසුකම් ඇති, <u>සේවයේ නියුතු නිලධාරීන්ගෙන්</u> අයදුම්පත් කැඳවනු ලැබේ. පරීක්ෂණ කටයුතු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2018 අනුව ගෙවීම් කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත මේ සමඟ අමුණා ඇති අතර එකී අයදුම්පතේ මෘදු පිටපත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන්ද බාගත කළ හැකිය.

**සුදුසුකම් :**

1) මාණ්ඩලික නිලධාරියකු වශයෙන් දස අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
2) සිය සේවා කාලය තුළ දී ආයතන සංග්‍රහය යටතේ දැක්වෙන වරදකට විනය දඬුවමක් ලබා නොතිබීම.

ඉහත සුදුසුකම් සපුරා ඇති, විනය පරීක්ෂණ නිලධාරි සංචිතයේ ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන නිලධාරීන් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර <u>දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශයේ ලේකම් හා පරිපාලන බලධරයා මඟින්</u> 2023.08.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත එවිය යුතුය.

වෙබ් අඩවිය : <u>www.psc.gov.lk</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

තනුජා මුරුගේෂන්
වැඩ බලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතය සඳහා සේවයේ නියුතු නිලධාරීන් ලියාපදිංචි කර ගැනීමේ අයදුම්පත්‍රය

### I කොටස

1. මුලකුරු සමඟ නම : ......................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම : ......................................................................

   ......................................................................
3. උපන් දිනය : ......................................................................
4. අයදුම්පත් භාර ගන්නා දිනට වයස : ......................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය : ......................................................................
6. ලිපිනය (කාර්යාලයීය) : ......................................................................

   : ......................................................................

   (පෞද්ගලික) : ......................................................................

   ......................................................................
7. දුරකථන අංකය (කාර්යාලයීය) : ......................................................................

   (පෞද්ගලික) : ......................................................................
8. වර්තමාන තනතුර/සේවය/ශ්‍රේණිය : ......................................................................
9. මුල් පත්වීම් දිනය : ......................................................................
10. කලින් දැරූ තනතුරු

    (අවසන් වරට දැරූ තනතුර මුලින් සඳහන් කරන්න. ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අමතර කොළයක් අමුණන්න.)

| | තනතුර | සේවා ස්ථානය | කාලය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

11. විනය පරීක්ෂණ මෙහෙය විය හැකි භාෂාව

    (අදාළ කොටුවේ හෝ කොටුවල "√" ලකුණ යොදන්න)

| සිංහල | | දෙමළ | | ඉංග්‍රීසි | |
|---|---|---|---|---|---|

12. විනය පරීක්ෂණ මෙහෙය විය හැකි දිස්ත්‍රික්ක :..............................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

13. (a) ඔබගේ සේවා කාලය තුළ ආයතන සංග්‍රහයේ II කාණ්ඩය යටතේ වැරදිකරුවකු වී තිබේද?
.......................................................................................................................................

(b) ඔබට එරෙහිව දැනට විනයානුකූලව කටයුතු කරමින් පවතීද ?
.......................................................................................................................................

14. විනය පරීක්ෂණ පැවැත්වීමේ පළපුරුද්ද (ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අමතර කොළයක් අමුණන්න.) : ..............................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

15. නීතිඥයෙකු වශයෙන් සුදුසුකම්/පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

මා විසින් සපයන ලද ඉහත තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

..........................................  ..........................................

දිනය  අයදුම්කරුගේ අත්සන

## II කොටස

.............................................................................................. මයා/මිය මෙම දෙපාර්තමේන්තුවේ ........................................................................ නිලධාරියකු / නිලධාරිනියක ලෙස සේවය කරන බව සහතික කරමි.

මෙම නිලධාරියා / නිලධාරිනිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතය සඳහා ලියාපදිංචිකර ගැනීම සම්බන්ධයෙන් මාගේ විරුද්ධත්වයක් නොමැති බවත්, එම නිලධාරියාට / නිලධාරිනියට එරෙහිව විනය කටයුතු පැවති / නොපැවති බව හා දැනට විනයානුකූලව කටයුතු කරමින් පවතින / නොපවතින බව ප්‍රකාශ කරමි.

දිනය : ..........................................  ..........................................

දෙපාර්තමේන්තු ප්‍රධානී

## III කොටස

......................................................................................................... මයා/මිය
................................................................................දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ
................................................................................ නිලධාරියකු / නිලධාරිනියක ලෙස සේවය කරන බව සහතික කරමි.

මෙම නිලධාරියා / නිලධාරිනිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතය සඳහා ලියාපදිංචිකර ගැනීම සම්බන්ධයෙන් මාගේ විරුද්ධත්වයක් නොමැති බවත්, එම නිලධාරියාට / නිලධාරිනියට එරෙහිව විනය කටයුතු පැවති / නොපැවති බව හා දැනට විනයානුකූලව කටයුතු කරමින් පවතින / නොපවතින බව ප්‍රකාශ කරමි.

දිනය : ..........................................

..............................................
අමාත්‍යාංශ ලේකම්

## IV කොටස

......................................................................................................... මයා/මිය
................................................................................දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ
................................................................................ නිලධාරියකු / නිලධාරිනියක ලෙස සේවය කරන බව සහතික කරමි.

මෙම නිලධාරියා / නිලධාරිනිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතය සඳහා ලියාපදිංචිකර ගැනීම සම්බන්ධයෙන් මාගේ විරුද්ධත්වයක් නොමැති බවත්, එම නිලධාරියාට / නිලධාරිනියට එරෙහිව විනය කටයුතු පැවති / නොපැවති බව හා දැනට විනයානුකූලව කටයුතු කරමින් පවතින / නොපවතින බව ප්‍රකාශ කරමි.

දිනය : ..........................................

..............................................
පරිපාලන බලධාරියා